සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 61 | S | I |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 11 - 2019

නම / විභාග අංකය : ............................................ භූගෝල විද්‍යාව - I කාලය : පැය 03යි.

වැදගත් :
- ✳ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.
- ✳ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

✳ **අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(01) ස්වාභාවික මෙන් ම විවිධ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ............................................................. වැනි අහිතකර වායු, වායුගෝලයට එක්වීමෙන් වායුගෝලීය සංයුතිය වෙනස් වේ. (නයිට්‍රජන් / ඔක්සිජන් / කාබන්ඩයොක්සයිඩ්)

(02) පස, ජලය හා ............................................................ ජෛව ගෝලීය ක්‍රියාකාරිත්වය සඳහා බලපාන අජීවී සාධක වේ.
(ශාක / සතුන් / හිරු එළිය)

(03) ද්‍රවමය ලෝහ සහ ඝන යකඩවලින් සමන්විත පෘථිවි ස්ථරය ...................................................... නම් වේ.
(කබොල / ප්‍රාවරණය / හරය)

(04) ආසියාවෙන් බැහැරව වී වගා කරන ප්‍රදේශයක් වන සැක්‍රමැන්ටෝ නිම්නය පිහිටා ඇත්තේ ............................................ මහාද්වීපය තුළ ය. (උතුරු ඇමරිකා / අප්‍රිකා / යුරෝපා)

(05) කබොක් මිශ්‍ර රතු පස ............................................................. වගාව සඳහා ඉතා යෝග්‍ය වේ.
(තේ / රබර් / පොල්)

(06) ඇතැම් ආදේශන භාණ්ඩවලින් එල්ලවන තරගය, ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය ආශ්‍රිත ............................................ හා සම්බන්ධ ගැටලුවකි. (වෙළඳාම / පාරිසරික / නිෂ්පාදන)

(07) ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් ව්‍යාප්ත වී ඇති ප්‍රධාන ප්‍රදේශයක් ලෙස .................................................... දැක්විය හැක. (බෝගල / පිත්තවල / තලාතු ඔය)

(08) ශ්‍රී ලංකාවේ වයඹ හා ගිනිකොණ දිග ප්‍රදේශවල උෂ්ණත්වය $27^0C$ ට වැඩි නිසා නියඟයට ඔරොත්තු දෙන ............................................................ වැනි ශාක බහුලව වැවේ.
(කරඹ, එරමිණියා / මිල්ල,තේක්ක / හොර, කීන)

(09) දකුණු ආසියාතික රටවල් අතර වාර්ෂික ජන සංඛ්‍යා වර්ධන වේගය අඩුම රට ............................................ වේ. (මාලදිවයින / ශ්‍රී ලංකාව / නේපාලය)

(10) මහාබාධක කඳුවැටිය පිහිටා ඇත්තේ ............................................................ මහද්වීපයේ ය.
(අප්‍රිකා / ආසියා / ඕස්ට්‍රේලියා)

✳ **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

(11) පෘථිවියේ ඇති විශාල කඳුවැටි නිර්මාණය වී ඇත්තේ භූ චලන හට ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ය. නි / වැ

(12) මෙසෝ ගෝලයේ ඉහළ සීමාව මුහුදු මට්ටමේ සිට 50km දක්වා විහිදෙයි. නි / වැ

(13) ලෝකයේ ප්‍රධාන ජන සංකේන්ද්‍රණ කලාපවලට ලෝක භූමියෙන් 64% අයත්වේ. නි / වැ

(14) ශ්‍රී ලංකාවේ තෙත් හා වියළි කලාප දෙකෙහිම ප්‍රධාන ගංගා ආශ්‍රිතව දියළු පස ව්‍යාප්ත වී ඇත. නි / වැ

(15) යාපනය අර්ධද්වීපයේ හා වයඹදිග මුහුදු තීරයේ ව්‍යාප්තව ඇති මයෝසීන හුණුගල් තීරය විපරීත පාෂාණ වර්ගයට අයත් වේ. නි / වැ

✳ **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දක්වේ. ඒවා සම්බන්ධතාවය අනුව ගැළපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.**

(16) ලෝකයේ භෞතික ලක්ෂණ කිහිපයක නම් 'අ' තීරුවේ ද ඒවා පිහිටි මහාද්වීප කිහිපයක නම් 'ආ' තීරුවේ ද දක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. බියේ සානුව | A - උතුරු ඇමෙරිකා මහාද්වීපය |
| 2. ඇපලේචියන් කඳු | B - අප්‍රිකා මහාද්වීපය |
| 3. නල්ලබාර් තැන්න | C - යුරෝපා මහාද්වීපය |
| | D - ඕස්ට්‍රේලියා මහාද්වීපය |

(1) B, A, D (2) D, A, B (3) B, C, D (4) D, A, C (............)

(17) ලෝකයේ වනාන්තර කීපයක නම් 'අ' තීරුවේ ද එහි විශේෂ ලක්ෂණ 'ආ' තීරුවෙන් ද දක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. නිවර්තන වර්ෂා වනාන්තර | A. ඉදිකටු වැනි ශාක පත්‍ර ඇත. |
| 2. සෞම්‍ය කලාපීය වනාන්තර | B. පැළැටි වර්ධනය වේගයෙන් සිදු වේ. |
| 3. කේතුධර වනාන්තර | C. සදාහරිත මෙන් ම පතනශීලි ශාක ද ඇත. |
| | D. පත්‍ර මාංසල ගතියෙන් යුක්තයි. |

(1) C, D, B (2) B, C, A (3) A,B, C (4) C, A, D (............)

(18) ශ්‍රී ලංකාවේ වී පර්යේෂණාගාර කීපයක් 'අ' තීරුවේ ද ඒවා පිහිටි පළාත 'ආ' තීරුවේ ද දක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. මහඉලුප්පල්ලම | A. බස්නාහිර පළාත |
| 2. අම්බලන්තොට | B. දකුණු පළාත |
| 3. බෝඹුවල | C. උතුරු මැද පළාත |
| | D. සබරගමු පළාත |

(1) B, A, D (2) C, B, D (3) C, B, A (4) A, C, B (............)

(19) ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික කර්මාන්ත කීපයක් 'අ' තීරුවේ ද එම කර්මාන්ත පිහිටි ප්‍රදේශ 'ආ' තීරුවේ ද දක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. වෙස් මුහුණු | A. පිළිමතලාව |
| 2. වේවැල් භාණ්ඩ | B. කොග්ගල |
| 3. පිත්තල කැටයම් | C. අම්බලන්ගොඩ |
| | D. රදාවඩුන්න |

(1) B, C, A (2) C, B, D (3) A, C, B (4) C, D, A (............)

(20) ලෝකයේ ජනාධික නගර කිහිපයක් 'අ' තීරුවේ ද ඒවා අයත් රටවල් 'ආ' තීරුවේ ද දක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. මුම්බායි | A. ජපානය |
| 2. ටෝකියෝ | B. චීනය |
| 3. ලන්ඩන් | C. එක්සත් රාජධානිය |
| | D. ඉන්දියාව |

(1) A, C, D (2) D, A, C (3) B, A, C (4) C, B, D (............)

✳ **අංක 21 සිට 26 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

(21) වොල්ගා ගඟ ගලා බසින්නේ .................................... මුහුදටයි.

(22) මහාද්වීපික කබොල .................................... පාෂාණ වලින් සමන්විත වේ.


(23) ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උයන පිහිටා ඇත්තේ .................................... දිස්ත්‍රික්කයේ ය.

(24) ශ්‍රී ලංකාවේ වෙරළ වටා ඇති ගංගා, මෝය, කලපු වැනි ජලාශ්‍රිත ප්‍රදේශ ආශ්‍රිතව .................................... ශාක බහුලව ව්‍යාප්ත වී ඇත.

(25) සාගර පතුල්වල, ගිනි කඳු පිපිරීම හා විශාල භූමිකම්පා ඇතිවීම හේතු කොට ගෙන වෙරළට ගමන් කරන විනාශ කාරී .................................... තරංග නිර්මාණය වේ.

(26) ශ්‍රී ලංකාවේ කාබනික පොහොර මධ්‍යස්ථානය පිහිටුවා ඇත්තේ .................................... දිස්ත්‍රික්කයේ ය.

✳ **27 සහ 28 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන් උපයෝගී කර ගන්න.**



A B C D


(27) ඉහත රූපසටහන් අතුරින් ජාලාකාර ජලවහන රටාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (............)

(28) ශාඛීය ජලවහන රටාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (............)

✳ **අංක 29 හා 30 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පහත ප්‍රස්තාරය යොදාගන්න.**




(29) ඉහත ප්‍රස්තාරයට අනුව උපරිම ජන සංඛ්‍යා වර්ධනයක් සිදු වී ඇත්තේ .................................... වර්ෂයේ දී ය.

(30) ජන සංඛ්‍යා වර්ධන අනුපාතය සමාන අගයකින් වසර දෙකක දී පහළ අගයක් ගෙන ඇත. එම අගය වන්නේ .................................... ය.

✳ **ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

(31) පෘථිවි වායුගෝලයේ දිවා රාත්‍රි උෂ්ණත්ව අන්තරය ඉහළ මට්ටමක පවතින වායු ස්ථරය වන්නේ මින් කුමක් ද?

(1) පරිවර්ති ගෝලය (2) අපරිවර්ති ගෝලය

(3) මෙසෝ ගෝලය (4) තාප ගෝලය (............)

(32) යුරේෂියා භූ තැටිය තුළ පිහිටි රටක් වන්නේ මින් කුමක් ද?

(1) බ්‍රිතාන්‍ය දූපත (2) කියුබාව

(3) මැඩගස්කරය (4) ග්‍රීන්ලන්තය (............)

(33) පහත් තැනිතලා ප්‍රදේශවල ගංගාව සෙමෙන් ගලන විට දී ගෙනන ද්‍රව්‍ය ගංගා මාර්ගයේ තැන්පත් වීමෙන් නිර්මාණය වන භූ ලක්ෂණය වන්නේ මින් කුමක් ද?

(1) වගුරු බිම (2) දූපත

(3) හැඩපළු ගංගාව (4) ගං මෝය (............)

(34) ශ්‍රී ලංකාවේ වැව් හා ජලාශවල වර්තමානයේ ඇති කරන මත්ස්‍යයන් වර්ග දෙකක් වන්නේ,

(1) ලූලා, කනයා ය. (2) හුංගා, කැට්ලා ය.

(3) කැට්ලා, ග්‍රාස්කාප් ය. (4) තිලාපියා, කාවයියා ය. (............)

(35) හෙමටයිට්, මැග්නටයිට්, ලිමොනයිට් යනාදිය මින් කුමන ඛණිජ වර්ගයට අයත් ද?

(1) හුණු ගල් (2) මිනිරන්

(3) ඛනිජ වැලි (4) යපස් (............)

(36) විද්‍යාත්මක හා පර්යේෂණ කටයුතු සඳහා පමණක් මහජනතාවට ඇතුළුවීමට අවසර ඇති රක්ෂිත භූමියක් වනුයේ මින් කුමක් ද?

(1) හග්ගල (2) සිංහරාජය

(3) වස්ගමුව (4) ත්‍රිකෝණමඩු (............)

(37) 1 : 50 000 පරිමාණයට ඇඳ ඇති භූ ලක්ෂණ සිතියමක වැවක වර්ග ප්‍රමාණය $16cm^2$ කි. එය වර්ග කිලෝමීටර්වලින් දැක් වූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

(1) $5\ km^2$ කි. (2) $4\ km^2$ කි.

(3) $8\ km^2$ කි. (4) $2\ km^2$ කි. (............)

(38) ශ්‍රී ලංකාවේ පොල් පර්යේෂණ ආයතනය පිහිටා ඇත්තේ කවර ප්‍රදේශයක ද?

(1) මාතලේ (2) තංගල්ල

(3) ලුණුවිල (4) අගලවත්ත (............)

✳ **පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 39 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. උපත් අනුපාතය
2. පිරමීඩ පතුල

B - 1. වායු දූෂණය
2. ෆොසිල ඉන්ධන භාවිතය

C - 1. සූර්ය බලශක්ති භාවිතය
2. පරිසර දූෂණය

D - 1. පාරිසරික සමතුලිතතාව
2. තිරසර සංවර්ධනය

(39) මෙහි පළමු වැන්නේ පැවැත්ම සඳහා දෙවැන්න අත්‍යාවශ්‍ය වේ යැයි සැලකිය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (............)

(40) දෙවැන්න නිසා පළමු වැන්නට අහිතකර ලෙස බලපාන මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (............)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

61 S II

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 11 - 2019

නම / විභාග අංකය : ............................................... භූගෝල විද්‍යාව - II

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.

✳ I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතු ය.

✳ II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1 : 50,000 හු ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

(i) අංක (1) න් දක්වා ඇත්තේ කුමක් ද? (ගංමෝය / දූපත / පහන් කණුව) (ලකුණු 01)

(ii) අංක (2) න් දක්වා ඇත්තේ කුමක් ද? (ගල්තලාව / වැලි පරය / හේන) (ලකුණු 01)

(iii) අංක (3) න් දක්වා ඇත්තේ කුමක් ද? (පාලම / බිංගෙය / බෝක්කුව) (ලකුණු 01)

(iv) අංක (4) න් දක්වා ඇත්තේ කුමක් ද? (තානායම / සංචාරක බංගලාව / හෝටලය) (ලකුණු 01)

(v) අංක (5) න් දක්වා ඇත්තේ කුමක් ද? (පළාත් මායිම / දිස්ත්‍රික් මායිම / උප දිසාපති කොට්ඨාස මායිම) (ලකුණු 01)

(vi) සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන ව්‍යාපාරික බෝගය කුමක් ද? (ලකුණු 01)

(vii) A අක්ෂරයෙන් දක්වා ඇති චතුරස්‍රය තුළ ඇති ජනාවාස රටාව කුමක් ද? (ලකුණු 01)

(viii) බෙන්තොට ගඟේ B ස්ථානයේ දී පළල කිලෝමීටර් කොපමණ ද? (ලකුණු 01)

(ix) සිතියමේ සාගරික කොටසෙහි C, D, E යන ස්ථාන තුන අතරින් වඩාත් ගැඹුරු ස්ථානය විය හැක්කේ කුමක් ද? (ලකුණු 01)

(x) P ලෙස දක්වා ඇති දුම්රිය නැවතුමේ සිට Q ලෙස දක්වා ඇති දුම්රියපොල දක්වා දුම්රිය මාර්ගයේ දුර කි.මී. කි.මී. වලින් දක්වන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 10)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) A, B හා C අක්ෂරවලින් දැක්වෙන විල් අතරින් බෝල්කෑෂ් විල දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F අක්ෂරවලින් දක්වා ඇති රටවල් අතරින් කපු වගාවට ප්‍රසිද්ධ ඊජිප්තුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G, H හා J අක්ෂරවලින් දක්වා ඇති ප්‍රදේශ අතරින් යපස් නිපදවන හැමස්ලේ වැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K, L හා M අක්ෂරවලින් දක්වා ඇති නගරවලින් රියෝද්ජනැයිරෝ නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) P, Q හා R අක්ෂරවලින් දක්වා ඇති ගංගා අතරින් මිසිසිපි ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) A, B හා C අක්ෂර අතරින් පැරණි සංචාරක නගරයක් වන දඹුල්ල නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F අක්ෂරවලින් දක්වා ඇති රක්ෂිත වනාන්තර අතරින් ආනවිලුන්දාව රක්ෂිතය දැක්වෙන අක්ෂරය කුමක් ද?


(iii) G, H හා J අක්ෂරවලින් මිරිදිය මසුන් බෝකරන ගිනිගත්හේන දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K, L හා M යන අක්ෂර අතරෙන් මැණික් ඛනිජය ඇති ඔක්කම්පිටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) P, Q හා R යන අක්ෂරවලින් ඩෙල්ෆ්ට් දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

## II කොටස

✳ **ප්‍රශ්න අංක 2 හා 3 සඳහා පහත දී ඇති සිතියම භාවිතා කරන්න.**




(02) (i) ඉහත සඳහන් ලෝක ආකෘති සිතියමේ A හා B වලින් දැක්වෙන දේශගුණික කලාප දෙක පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) A දේශගුණික කලාපයට අයත් අංක 1 න් දැක්වෙන වනාන්තරය ද අංක 2න් දැක්වෙන කාන්තාරය ද නම් කරන්න.

(b) B දේශගුණ කලාපය ව්‍යාප්ත වී ඇති අක්ෂාංශ පරතරය දක්වන්න. (ලකුණු 03)

(iii) (a) C දේශගුණ කලාපයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් නම් කරන්න.

(b) දේශගුණය මිනිස් කටයුතු කෙරෙහි බලපාන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) ලෝකයේ වී වගා කරන P අක්ෂරයෙන් දැක්වෙන රට ද තිරිඟු වගා කරන R අක්ෂරයෙන් දැක්වෙන රට ද නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) තිරිඟු හා වී වගාවට යෝග්‍ය පස පිළිවෙළින් නම් කරන්න.

(b) ආසියාවේ හා ආසියාවෙන් බැහැරව වී වගා කරන කලාප දෙක අතර විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) වර්තමානයේ වී වගාව සඳහා භාවිතා කරන නව තාක්ෂණික ක්‍රම දෙකක් ලියන්න.

(b) ලෝක ජනතාව අතර තිරිඟු ජනප්‍රිය ආහාරයක් වීමට බලපා ඇති හේතු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) (a) 1950 වන විට ලෝකයේ මෝටර් රථ නිෂ්පාදනයේ පෙරමුණේ සිටි රට කුමක් ද?

(b) 2012 වන විට මෝටර් රථ නිෂ්පාදනයේ දී පෙරමුණේ සිටින රට කුමක් ද? (ලකුණු 02)

(ii) මෝටර් රථ නිෂ්පාදනය ආශ්‍රිත නව ප්‍රවණතා තුනක් ලියන්න. (ලකුණු 03)


(iii) (a) ශ්‍රී ලංකාවේ මයික්‍රො මෝටර් රථ කම්හල පිහිටා ඇත්තේ කුමන ප්‍රදේශයේ ද?

(b) ශ්‍රී ලංකාවේ බෝට්ටු නිපදවන ප්‍රදේශයක් නම් කරන්න.

(c) ශ්‍රී ලංකාවේ බෝට්ටු මිලදී ගන්නා රටක් නම් කරන්න.

(d) වර්තමානයේ මෝටර් රථ නිෂ්පාදනයේ දී වෙළඳපොළ ජය ගැනීමට ලෝකයේ රටවල් අනුගමනය කර ඇති උපක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 05)

**(05) පහත සඳහන් ශ්‍රී ලංකා ආකෘති සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(i) (a) ශ්‍රී ලංකාවේ බහුලව ම භාවිතා කරන බලශක්ති ප්‍රභවය නම් කරන්න.

(b) පරිසර හිතකාමී බලශක්ති මූලයක් නම් කරන්න. (ලකුණු 02)

(ii) A අක්ෂරයෙන් දැක්වෙන ජලවිදුලි බලාගාරය නම් කරන්න.

B අක්ෂරයෙන් දැක්වෙන සුළං බලාගාරය නම් කරන්න.

C අක්ෂරයෙන් දැක්වෙන තාප විදුලි බලාගාරය නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) H අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න.

(b) බලශක්ති සම්පත් පරිහරණය කිරීමේ දී මතු වන ගැටලු දෙකක් ලියන්න.

(c) බලශක්ති සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කම කරුණු එකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(06) (i) පුනර්ජනනීය සම්පත් වර්ග 2ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) පහත සඳහන් පාෂාණ අයත් වන මූලික පාෂාණ වර්ගය පිලිවෙළින් නම් කරන්න.

1. ග්‍රැනයිට් 2. හුණුගල්

(b) ලෝහ නොවන ඛනිජයක් නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) පස නිර්මාණය වීමට බලපාන සාධක 02ක් ලියන්න.

(b) පස සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) රටක සංවර්ධනය මැනීමේ දී භාවිතා කරන සම්ප්‍රදායික මිනුමක් හා නූතන මිනුමක් පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ii) මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරීමේ දී යොදා ගන්නා මූලිකාංග 3 කවරේ ද? (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ ගම හා නගරය අතර ඇති පරතරය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කොට ඇති සංවර්ධන ව්‍යාපෘති 2 බැගින් ලියන්න.

(b) වර්තමානයේ තොරතුරු සන්නිවේදන පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ලබාගත හැකි වාසි 2ක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(08) (i) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වැඩි ම හා අඩු ම පළාත් දෙක නම් කරන්න. (ලකුණු 02)


(ii) ජන සංඛ්‍යා වියපත් වීම යන්න පැහැදිලි කොට ඒ නිසා ශ්‍රී ලංකාවට මුහුණදීමට සිදුවන අහිතකර ප්‍රතිඵල 2ක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව මිලියනය ඉක්ම වූ දිස්ත්‍රික්ක 2ක් නම් කරන්න.

(b) ජන සංඛ්‍යාව අධික වීම නිසා මතුවන ගැටලු 02ක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) / (ஆ) / (b)




(i) ☐


(ii) ☐

(iii) ☐

(iv) ☐

(v) ☐

(ඉ) / (இ) / (c)




(i) ☐

(ii) ☐

(iii) ☐

(iv) ☐

(v) ☐

(1) (අ) அ (a) $\overline{\quad}$ 10 (ආ) (ஆ) (b) $\overline{\quad}$ 5 (ඉ) (இ) (c) $\overline{\quad}$ 5 = $\overline{\quad}$ 20

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

| 61 | S | II |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 11 - 2019

නම / විභාග අංකය : ............................................ භූගෝල විද්‍යාව - II

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. (For Examiner's Use Only)

(1) (අ) அ (a)

(i) ....................................................................................................

(ii) ....................................................................................................

(iii) ....................................................................................................

(iv) ....................................................................................................

(v) ....................................................................................................

(vi) ....................................................................................................

(vii) ....................................................................................................

(viii) ....................................................................................................

(ix) ....................................................................................................

(x) ....................................................................................................

10

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

61 S II

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 11 - 2019

නම / විභාග අංකය : ............................................ **GEOGRAPHY - II** භූගෝල විද්‍යාව - II




SCALE : 1 : 50 000

N

95

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 11 - 2019

## භූගෝල විද්‍යාව පිළිතුරු පත්‍රය

### I පත්‍රය

(1) - කාබන්ඩයොක්සයිඩ්
(2) - හිරුඑළිය
(3) - හරය
(4) - උතුරු ඇමෙරිකා
(5) - රබර්
(6) - වෙළෙඳාම
(7) - බෝගල
(8) - කරඹ, එරමිණියා
(9) - ශ්‍රී ලංකාව
(10) - ඕස්ට්‍රේලියාව
(11) - නි
(12) - වැ
(13) - වැ
(14) - නි
(15) - වැ
(16) - 1. (BAD)
(17) - 2. (BCA)
(18) - 3. (CBA)
(19) - 4. (CDA)
(20) - 2. (DAC)
(21) - කැස්පියන්
(22) - ග්‍රැනයිට්
(23) - මහනුවර
(24) - කඩොලාන
(25) - සුනාමි
(26) - කුරුණෑගල
(27) - B
(28) - A
(29) - 1953
(30) - 0.8
(31) - (4) තාප ගෝලය
(32) - (1) බ්‍රිතාන්‍ය දූපත්
(33) - (3) හැඩපළු ගංගාව
(34) - (3) කැට්ලා, ග්‍රාස්කාප්
(35) - (4) යපස්
(36) - (1) හඟුල
(37) - (2) $4 km^2$
(38) - ලුණුවිල
(39) - D
(40) - B

(ලකුණු 1x40=40යි)

### II පත්‍රය

#### I කොටස

(01) (අ) (i) ගංමෝය (ලකුණු 1)
(ii) වැලිපරය (ලකුණු 1)
(iii) පාලම (ලකුණු 1)
(iv) සංචාරක බංගලාව (ලකුණු 1)
(v) පළාත් මායිම (ලකුණු 1)
(vi) පොල් (ලකුණු 1)
(vii) රේඛීය ජනාවාස (ලකුණු 1)
(viii) 0.5 km (ලකුණු 1)
(ix) E (ලකුණු 1)
(x) 3.5 km (ලකුණු 1) (ලකුණු 10)

(ආ) (i) B (ii) F
(iii) H (iv) K
(v) R (ලකුණු 5)

(ඉ) (i) A (ii) E
(iii) J (iv) L
(v) P (ලකුණු 5)

(ලකුණු 10)

#### II කොටස

(02) (i) A - නිවර්තන කලාපය
B - සෞම්‍ය කලාපය (ලකුණු 2)

(ii) (a) 1 - ඇමෙසන් වනාන්තරය
2 - සහරා කාන්තාරය

(b) • කර්කටක නිවර්තනයේ සිට ආක්ටික් වෘත්තය දක්වා
• මකර නිවර්තනයේ සිට ඇන්ටාක්ටික් වෘත්තය දක්වා

(ලකුණු 3)

(iii) (a) • වාර්ෂික වර්ෂාපතනය ඉතා පහළ වේ.
• 200mm - 300mm අතර වේ.
• තුහිනය හා හිම පතනය වීම සිදුවේ.

(b) • වගාවන් සඳහා, ආහාර පාන, ඇඳුම් පැළඳුම්, ගමන් බිමන් යාම, වාසස්ථානවල ජීවත්වීමේ දී ..... කරුණු දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කළ යුතු යි.

(ලකුණු 5)

**(ලකුණු 10)**

(03) (i) P - තායිලන්තය

R - ආර්ජන්ටිනාව (ලකුණු 2)

(ii) (a) තිරිඟු වගාව - චර්නෝසම් පස

වී - දියළු පස

(b) ආසියාතික රටවල් -

ප්‍රධාන ආහාරය බත් වීම/ නිපදවන ප්‍රදේශවලම පරිභෝජනය කිරීම /ශ්‍රම සූක්ෂම වගාවක් වීම / කුඩා ගොවිබිම්වල වගා කිරීම.

ආසියාවෙන් බැහැර රටවල් -

විශාල ගොවිබිම්වල වගා කිරීම, වාණිජ පදනමකින් වගා කිරීම, යන්ත්‍ර සූත්‍ර භාවිතය වැඩි වීම (ලකුණු 5)

(iii) (a) ජාන තාක්ෂණය උපයෝගී කොටගෙන උසස් වර්ගයේ බීජ භාවිතය, විශේෂ ගුණාංගවලින් යුත් සහල් නිපදවීම. උදා : රන් සහල්

නව නිෂ්පාදන බිහි කිරීම - සහල් පිටි බිස්කට්

(b) විවිධ ආහාර වර්ග රැසක් නිපදවිය හැකිවීම බොහෝ දෙනාට හුරු පුරුදු ආහාරයක් බවට පත් වී තිබීම, ආහාර වර්ග නිපදවීම පහසු වීම.

(මෙහි කරුණ පැහැදිලි කිරීමට 01, කරුණකට 01) (ලකුණු 3)

**(ලකුණු 10)**

(04) (i) (a) අමෙරිකා එක්සත් ජනපදය

(b) චීනය (ලකුණු 2)

(ii) එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වීම.

නිෂ්පාදන අයිතිය බහු ජාතික සමාගම් සතු වීම

නව තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය

විවිධ වර්ගයේ නිෂ්පාදන බිහිකිරීම (ලකුණු 3)

(iii) (a) පොල්ගහවෙල

(b) කළුතර, මීගමුව, බේරුවල, මිරිස්ස, පානදුර, කොරලවැල්ල

(c) ඉන්දියාව, මාලදිවයින සිංගප්පූරුව, නෝර්වේ, ද. කොරියාව

(d) නව තාක්ෂණික ක්‍රම යෙදීම, අලංකාර පෙනුම, විවිධ නිෂ්පාදන සිදු කිරීම, මිල පිළිබඳව සැලකිලිමත් වීම.

(ලකුණු 5)

**(ලකුණු 10)**

(05) (i) (a) ජෛව ස්කන්ධය

(b) සූර්ය ශක්තිය, සුළං (ලකුණු 2)

(ii) A - ලක්ෂපාන, B - පුත්තලම,C - කෙරවලපිටිය

(ලකුණු 3)

(iii) (a) වළවේ ගඟ

(b) පිරිවැය අධිකවීම, ස්වාභාවික ආපදා මගින් හානි සිදුවීම, නාස්තිය හා අපතේ යාම, ඇතැම් ඒවා පරිසර සාධක මත තීරණයක්

(c) විදේශ විනිමය ඉතිරි කරගත හැකිවීම, රටේ සංවර්ධනයට දායක වීම, කාලය ඉතිරිවීම, මුදල් නාස්තිය අවම වීම.

(ලකුණු 5)

**(ලකුණු 10)**

(06) (i) වනාන්තර, පස, වන ජීවීන්, මත්ස්‍යයන්

(ලකුණු 2)

(ii) (a) ග්‍රැනයිට් - ආග්නේය, හුණුගල් - අවසාදිත

(b) මිනිරන්, වැලි, හුණුගල්, පොස්පේට්

(ලකුණු 3)

(iii) (a) මව් පාෂාණය, භූවිෂමතාවය, දේශගුණය, කාලය

(b) වනාන්තර ප්‍රතිරෝපණය කිරීම, පරිසරයට හිතකර බෝග වැවීම, වැටි දැමීම, පිඩලි ඇල්ලීම, අගල් කැපීම, කොරල් කැඩීම තහනම් කිරීම .... මින් එකක් පැහැදිලි කිරීම.

(ලකුණු 5)

**(ලකුණු 10)**

(07) (i) පැරණි මිනුම් -

මූර්ත දළ ජාතික නිෂ්පාදනය

ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය

දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය

නූතන මිනුම් -

භෞතික ජීවන තත්ත්ව දර්ශකය

මානුෂ සංවර්ධන දර්ශකය

මානුෂ දරිද්‍රතා දර්ශකය (ලකුණු 2)

(ii) උපතේදී ආයු අපේක්ෂාව

සාක්ෂරතාව

ක්‍රය ශක්තියට හා ගැළපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය (ලකුණු 3)

(iii) (a) ගම - දිවිනැගුම, ගැමි දරිය, ප්‍රජා මූල ජල ව්‍යාපෘති, ගැමි දිරිය, සමෘද්ධි, ජනසවිය

නගරය - නගර අලංකරණය, මාර්ග පුළුල් කිරීම, නව වෙළෙඳ සංකීර්ණ ඉදි කිරීම, කසළ කළමනාකරණ වැඩසටහන්

(b) අධ්‍යාපනට නව මං හෙළි කර දීම.

රැකියා අවස්ථාවන් ඇතිවීම.

රටේ අභ්‍යන්තර හා බාහිර සබඳතා වැඩි දියුණු වීම.

ආපදා අවස්ථාවලදී දායක කර ගැනීමට හැකි වීම.... (ලකුණු 5)

(ලකුණු 10)

(08) (i) වැඩිම - බස්නාහිර පළාත

**Answer**

අඩුම - උතුරු පළාත (ලකුණු 2)

(ii) අවුරුදු 59ට වැඩි, වැඩිමහල් යැපෙන්නන්ගේ සංඛ්‍යාව වැඩිවීම යි.

ශ්‍රම බලකාය ක්‍රමයෙන් අඩුවීම, වැඩිහිටි යැපෙන්නන් වැඩි වීම, ඖෂධ වර්ග හා රැක බලා ගැනීම අවශ්‍ය වීම, නිෂ්පාදනයට දායකවීම ඉතා අවම මට්ටමක වීම.... (ලකුණු 3)

(iii) (a) කොළඹ, ගම්පහ, කුරුණෑගල, මහනුවර, කළුතර, රත්නපුර, ගාල්ල

(b) ආහාර හිඟය, නිවාස හිඟය, කැලිකසල ගොඩ ගැසීම, පරිසර දූෂණය, මුඩුක්කු නිවාස ඉදිවීම.

(ලකුණු 5)

(ලකුණු 10)